# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

## මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

## தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

**24/2, 28th Lane, Off Flower Road, Colombo 07.**
**Tel: +94 11 2565304 – 6, 5552746, 5552748, Fax:+94 11 4714460**
**E-mail: cpa@cpalanka.org Website : www.cpalanka.org**


අවධානය- ප්‍රවෘත්ති කර්තෘ

| |
|---|
| මැතිවරණ ආශ්‍රිත ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව වන මාධ්‍ය නිවේදනය<br>නැගෙනහිර පළාත් සභා මැතිවරණය 2008 |
| 2008 මැයි 10 වැනි දා - පෙ.ව 2.00 -මාධ්‍ය නිවේදනය 1 |

## මඩකලපුව දිස්ත්‍රික්කය

**පදිරිප්පුහිදී ඡන්දදායකයන් බියවැද්දීම**

ඊයේ රාත්‍රියේදී පදිරිප්පුවේ කළුදාවලි ගමේ නිවෙස් ගණනාවක දී සන්නද්ධ ටී.එම්.වී.පී සාමජිකයන් විසින් ඡන්දදායකයන් බියවද්දා ඇත. ඡන්දදායකයන්ගේ ඡන්දකාඩ්පත් ද ටී.එම්.වී.පී. සාමාජිකයන් විසින් රැගෙන ගොස් ඇත. මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (මැ.ප්‍ර.නි.ම. -CMEV) විසින් කලවන්චිකුඩි පොලිස් ස්ථානයෙන් විමසූ විට දැනුම් දෙනු ලැබුවේ ඒ පිළිබඳව පැමිණිල්ලක් ලැබී ඇති බව සහ පොලිස් ජංගම කණ්ඩායම් එම සිදුවීම විභාගකරමින් සිටින බවය. ඊයේ සධ්‍යාකාලයේ ටී.එම්.වී.පී. සාමාජිකයන් විසින් කළුදාවලි ගමේ ඡන්දදායකයන්ගෙන් ඡන්දකාඩ්පත් ලබා ගැනීමේ යෙදී සිටි බව ප්ලොට් (PLOTE ) නායක සිද්ධාර්ථන් මහතා තහවුරු කළේය.

**කල්ලඩිහිදී ජ්‍යේෂ්ඨ ඡන්ද මධ්‍යස්ථානාධිපතිවරයෙකු බිය ගැන්වීම.**

ජ්‍යේෂ්ඨ ඡන්දමධ්‍යස්ථානාධිපති වරයෙකු මැ.ප්‍ර.නි.ම. වෙත දැනුම් දී සිටියේ 8 වන දින මධ්‍යම රාත්‍රියේ දී ටී.එම්.වී.පී.ය විසින් තමා අමතා ඡන්ද දිනයේ දහවල් 12 න් පසු කිසිම ඡන්දදායකයෙකුට ඡන්දපොල මධ්‍යස්ථානයට ඇතුළු වීමට ඉඩ නොදෙන ලෙස කියාසිටි බවයි.

**වාලච්චේනේහිදී බිය ගැන්වීම්**

ඊයේ ප.ව. 6.30 ට පමණ නිවෙස් 7 ක වැසියන් බියගන්වනු ලැබ ඇත. ඔට්ටමාවඩි (නිවෙස් 2) මීරාවොදනි (නිවෙස් 3) සහ වාලච්චේනෙයි (නිවෙස් 2) වශයෙන් වූ මුස්ලිම් කොංග්‍රස් ආධාරකරුවන්ගේ නිවෙස්වල වැසියන්හට මැරවරයන් විසින් තර්ජනය කරනු ලැබ ඇත.

ඔට්ටමාවඩ්ඩිහි දී පහරදීමට ලක් වූ එක් නිවෙසක හිමිකරු වූයේ හිටපු පළාත් සභා මන්ත්‍රී එස්.එම්.එල්. හනීෆා මහතායි. හනීෆා මහතා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා මධ්‍යස්ථානය වෙත කියා සිටියේ මැරවරයන් ප.ව 7.50 ට පමණ සුදු පැහැති වෑන් රථයකින් පැමිණි බවය. පොලිස් කොස්තාපල්වරයෙකු ඉදිරි අසුනෙහි සිට ඇති නමුත් රථයෙන් බිමට බැස නැත. ඔවුන් හනීෆා පවුලේ සාමාජිකයන්ට තර්ජනය කොට ඡන්දය පාවිච්චි නොකරන ලෙස කියා ඇත. නිවසේ ඇතැම් ජනේල ඔවුන් විසින් කඩා දමා ඇත. මැරවරයන් කළු ඇඳුමින් සැරසී කළු මුහුණු ආවරණයන් පැළද සිට ඇත.

කල්කුඩා FM (96.1) ගුවන් විදුලිය මගින් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ප්‍රචාරයන් විසුරුවා හරින බව මැතිවරණ ප්‍රචණ්ඩ කියා මධ්‍යස්ථානය වෙත දැනුම් දෙනු ලැබිණි. මෙම ගුවන් විදුලිය අමීර් අලි ඇමතිවරයාගේ නිවසේ සිට ක්‍රියාත්මක වන බවට චෝදනා එල්ල වී ඇත.

අමීර් අලි ඇමතිවරයා මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත පැමිණිලි කොට සිටියේ තමාට දුරකථනයෙන් තර්ජනය කරනු ලැබූ බවය. තර්ජනය සඳහා භාවිතා කෙරුණු දුරකථන අංකය 0714910458 බව ඔහු කියා සිටියේය. මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය මෙම අංකයට ඇමතූ විට සම්බන්ධතාවය නොලැබිණි. තමා කිසිදු ප්‍රචණ්ඩ ක්‍රියාවකට සම්බන්ධ නොවන  බව කියා සිටි ඒ මහතා ගුවන් විදුලි මධ්‍යස්ථානයේ විසුරුවා හැරීම්  8 වන දා රාත්‍රියේ අවසන් කරනු ලැබූ බව ද සඳහන් කළේය.

වාලච්චේනයි පොලිසිය ඇමතූ විට ඔවුන් කියා සිටියේ යම් සුළු සිදුවීම් කිහිපයක් ඇති වී ඇති බව හා නිවෙස් වලට ගල් ගැසීම් පිළිබඳව පැමිණිලි කිහිපයක් ලැබී ඇති බවය. මේ පිළිබඳව පරීක්ෂණ කටයුතු සඳහා ජංගම පොලිස් කණ්ඩායම් යොමුකොට ඇති බවද කියැවිණි. තර්ජනය කිරීමකට ලක්වූවකු වන හනීෆා මහතා මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV)  වෙත දැනුම් දුන්නේ පරීක්ෂණයක් පැවැත්වීම සඳහා සහකාර පොලිස් අධිකාරීවරයෙකු තම නිවසට පැමිණි බවය. වාලච්චේනයි පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක කොඩිසිංහ මහතා මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත දැනුම් දී සිටියේ නීතිය හා සාමය  පවත්වාගෙන යාමට සහාය වන ලෙස පොලිසිය විසින් යුධ හමුදාවෙන් ඉල්ලීමක් කරනු ලැබ ඇති බවයි.

## අම්පාර   දිස්ත්‍රික්කය

### පදියතලාවේ දී පහරදීම් සහ අඩන්තේට්ටම් කිරීම්

පසුගිය රාත්‍රියේදී පදියතලාවේ, කිරිවන පිහිටි සිය නිවසේදී එක්සත් ජාතික පක්ෂ ආධාරකරුවකු වන දයාරත්න මහතාට පහර දෙනු ලැබ ඇත. නිවසෙහි ජනේල්ද කඩාබිඳ  දමනු ලැබිණි. පහරදීමෙහි දී ඔහුට තුවාල සිදුවිය. නමුත් ඒවා බරපතල ස්වභාවයේ නොවන බව වාර්තාවේ. මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV)  විසින් පදියතලාව පොලිසිය ඇමතූ විට ඔවුන් කියා සිටියේ ඒ පිළිබඳව පැමිණිල්ලක් ලැබී ඇති බව සහ සිදුවීම ඇති වූ ස්ථානයට ඔවුන් ගිය බවය. පොලිසිය කියා සිටින්නේ පහරදීමට ගොදුරු වූ අය තමාට පහරදුන් පුද්ගලයන් හඳුනා ගැනීමට නොහැකිබව ප්‍රකාශ කළ බවය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA), නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (FMM ) සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි සන්ධානය එක්ව 1997 දී මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කරනු ලැබුයේ ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයක් ලෙස මැතිවරණය ආශ්‍රිත ප්‍රචණ්ඩක්‍රියා සිදුවීම් නිරීක්ෂණය කිරීම අරමුණු කොට ගෙනය. එය වර්තමානයේදී සමන්විත වනුයේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA), නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (FMM) සහ ඉන්ෆෝම් මානව හිමිකම් ලේඛන මධ්‍යස්ථානය (INFORM) යන සංවිධාන වලිනි.

| | | |
|---|---|---|
| ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු | උදය කලුපතිරණ | සීතා රංජනී |
| සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු |
| මැ.ප්‍ර.නි.ම | මැ.ප්‍ර.නි.ම | මැ.ප්‍ර.නි.ම |